## පළමුවැනි පරිශිෂ්ටය

(අ ) 1959 දී රජය විසින් සකස් කර ගන්නා ලද ප්‍රධාන නීති පැනවීම්

(ආ) 1959 දී මුදල් මණ්ඩලය විසින් සකස් කර ගන්නා ලද ප්‍රධාන පාලන විධිවිධාන.

# 1959 වර්ෂය තුළ රජය මගින් සකස් කර පණවන ලද නීති පිළිබඳ සටහන්

## 1952 අංක 1 දරණ බැංකු හර බදු (සංශොධන) පණත

1952 අංක 42 දරණ බැංකු බර බදු පණත සංශොධනය කිරීට සඳහා පණනයි.

(අනුමත කළ දිනය – 1959 ජනවාරි 21 වැනිද.)

වර්තමාන පාර්ලිමේන්තුවට රැස් වූ ලංකාවේ උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ අනුශාසනය හා අනුමැතිය අනුව හා ඇතිව එහිම බලය ප්‍රකාර අත්‍යුත්තම ප්‍රතාපවත් මහා රාජිණිය විසින් මෙසේ පනවනු ලැබේ.

**කෙටි නාමය**

1. මේ පණත 1959 අංක 1 දරණ බැංකු හර බදු (සංශොධන) පණත යනුවෙන් හැඳින්වෙයි.

**1957 අංක 42 දරණ පණතේ 5 වන වගන්තිය සංශොධනය කිරීම**

2. ප්‍රධාන පණත යයි සඳහන් කරන 1957 අංක 42 දරණ බැංකු හර බදු පණතෙහි 5 වන වගන්තිය, තත් වගන්තියෙහි 1 වැනි උප වගන්තිය ''දින දහතරක්'' යන වචන වෙනුවට 'තිස් දිනක්' යන වචන යෙදීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**ප්‍රධාන පණතේ 15 වැනි වගන්තිය සංශොධන කිරීම**

3. ප්‍රධාන පණතෙහි 15 වැනි වගන්තිය ''තිස් දිනක්'' යන වචන වෙනුවට ''හතළිස් හතර දිනක්'' යන වචන යෙදීමෙන් මෙයින් සංශොධනය කරනු ලැබේ.

**මේ පණතෙහි අරමුණ වනුයේ මහ බැංකුවේ ප්‍රධාන ගණකාධිකාරී තැන වෙත වෙළඳ බැංකු විසින් බදු ඉදිරිපත් කළයුතු කාල සීමාව දීර්ඝ කිරීම සහ අය විය යුතු මුළු හර ප්‍රමාණය පිළිබඳ ත්‍රෛමාසික සහතික, බැංකු විසින් ගෙවා ඇති බදු ප්‍රමාණය, ඔවුන් විසින් ලබා ගන්නා ලද ගාස්තු හා එකතු නොකරන ලද බදු සම්බන්ධව මහ බැංකුවේ අධිපති වරයා විසින් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් තැන වෙත සැපයිය යුතු තොරතුරු සැපයීමේ කාල සීමාව දීර්ඝ කිරීමයි.**

## 1959 අංක 5 දරණ ණය බේරුම් කිරීමේ (සංශොධන) පණත

1941 අංක 39 දරණ ණය බේරුම් කිරීමේ ආඥා පණත සංශොධනය කිරීම සඳහා පණතයි.

අනුමත කළ දිනය—1959 පෙබරවාරි 9 වැනිද.)

වර්තමාන පාර්ලිමේන්තුවට රැස් වූ ලංකාවේ උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ අනුශාසනය හා අනුමැතිය ඇතිව එහිම බලය ප්‍රකාර අත්‍යුත්තම ප්‍රතාපවත් මහා රාජිණිය විසින් මෙසේ පනවනු ලැබේ.

**කෙටි නාමය**

මේ පණත 1959 අංක 5 දරණ ණය බේරුම් කිරීමේ සංශොධන පණත වශයෙන් හැඳින්වෙයි.

**1941 අංක 39 දරණ ආඥා පණතට 19 (අ) සහ 19 (ආ) යන අළුත් වගන්තිය ඇතුලත්කිරීම.**

පහත දැක්වෙන අලුත් වගන්තිය 19 වැනි වගන්තියට එක්බිතිවම ඇතුලත් කරනු ලැබේ. ඒ වගන්තිය මෙයින් මතු ප්‍රධාන ප්‍රඥප්තිය වශයෙන් සඳහන් කෙරෙන ණය බේරුම් කිරීමේ ආඥා පණතෙහි 19 (අ) වගන්තිය හා 19 (ආ) වගන්තිය වශයෙන් ක්‍රියාවේ යෙදෙයි.

19 (අ) 1. යම්කිසි ණය ගැතියකු විසින් ඔහු හා ණය හිමියාත් අතර නීත්‍යානුකූලව ක්‍රියාවේ යෙදිය හැකි ගිවිසුමක් අනුව යම්කිසි දේපොලක් මේ ආඥා පණතෙහි අර්ථ ප්‍රකාර උකසක් වශයෙන් පවරා දීමෙන් ණයක් ගෙන තිබේ නම්, ඒ දේපොල බේරුම් කර ගැනීමට නියමිත කාලසීමාව අවසන් වීමට යටත් පිරිසෙයින් දින තිහකට පෙර ඉල්ලුම් පතක් ඉදිරිපත් නොකළ හොත්, ණය ගැතියකු හෝ ණය හිමියකු හෝ ඉදිරිපත් කරන එවැනි ඉල්ලුම් පතක් මණ්ඩලය විසින් පිළිගනු නො ලැබේ.

19 (අ) 2. පළමු වන වගන්තියේ සඳහන් කරනු ලබන ණයක් සම්බන්ධයෙන් ණය ගැතියකු විසින් මණ්ඩලයට ඉදිරිපත් කරන ඉල්ලුම් පතක්, මණ්ඩලය පිළිගත් විට මණ්ඩලය විසින් ඒ කරුණ පිළිබඳව ලේකම්වරයා විසින් අත්සන් කරනු ලබන දැන්වීමක්, ඉල්ලුම් පතෙහි පිටපතක් ද සමග ඉල්ලුම් පතට සම්බන්ධ වූ ණය හිමියා වෙත ලියාපදිංචි කල තැපැලෙන් යැවිය යුතු ය.

19 (ආ) 1. යම්කිසි ණය හිමියෙකුට, 19 (අ) වගන්තියේ 2 වැනි උප වගන්තිය අනුව ඒ වගන්තියේ 1 වැනි උප වගන්තියේ සඳහන් කරනු ලැබූ ණයක් පිළිබඳව ණය ගැතියකුගේ ඉල්ලුම් පතක් සම්බන්ධයෙන් දැන්වීමක් ලැබුණ විට මණ්ඩලය විසින් තත් ඉල්ලුම් පත ප්‍රතික්ෂෙප කරනු ලැබූයේ නම් හෝ ආඥා පණත අනුව කරන ලද බේරුම් කිරීම අනුව, එවැනි දේපොල බැහැර කිරීමට අවසරදී තිබේ නම් හෝ මිස, ඔහු ඒ දැන්වීමේ සඳහන් දේපොල විකිණීම, අන්සතු කිරීම, පවරා දීම, බදු දීම හෝ උකස් කිරීම හෝ නො කළ යුතු ය.

2. 1 වැනි උප වගන්තිය උල්ලංඝනය කොට කරන ලද විකිණීමක්, අන්සතු කිරීමක්, පවරා දීමක් හෝ උකස් කිරීමක් හෝ නීත්‍යානුකූල නොවේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 21 (අ) යන අළුත් වගන්තිය ඇතුලත්කිරීම

3. පහත දැක්වෙන අළුත් වගන්තිය 21 වැනි වගන්තියට එක්බිතිව මෙයින් ඇතුලත් කරන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 21 (අ) වගන්තිය වශයෙන් ක්‍රියාවේ යෙදෙයි.

21 (අ) මේ ආඥා පණත යටතේ චංචල දේපොල තාවකාලිකව පවරා දීමක් පිළිබඳ ඉල්ලුම් පතක් සම්බන්ධව යම්කිසි නීති කෘත්‍යයක දී එවැනි පවරා දීමක් සත්‍යයෙන්ම උකසක් දැයි තිරණය කිරීම සඳහා මණ්ඩලය, තත් කරුණු පිළිබඳව සෑම දෙයක්ම සැළකිල්ලට භාජනය කරන අතර විශේෂයෙන් පහත දැක්වෙන කරුණු සැළකිල්ලට භාජනය කරයි.

(අ) පවරා දීම පිළිබඳ නීත්‍යානුකූල නොතාරිස් ලේඛනයේ භාෂා අධ්‍යාශය සහ පවරා දෙනු ලබන දේපොල බේරුම් කිරීමට පැවරුම් ලැභියාට ඇති අයිතිය, පිළිබඳ විධිවිධාන වෙනත් නීත්‍යානුකූල නොතාරිස් ලේඛනයකින් දක්වා ඇත්තේ නම්, එම නීත්‍යානුකූල ලේඛනයේ භාෂා අධ්‍යාශය.

(ආ) පැවරුම්කරුගේ දේපොලවල වටිනාකම හා පවරා ගත් මුදල අතර යම් වෙනසක් තිබේ නම් එම වෙනස

(ඇ) එසේ පවරා දෙනු ලබන දේපොලවල භුක්තිය පැවරුම්කරු තබා ගැනීම.

(ඉ) පැවරුම්කරු ගත් මුදල පිළිබඳව, යුක්ති සහගතව පොලී වශයෙන් සැළකිය හැකි යම් මුදලක් හෝ පොලියක් හෝ පැවරුම්කරු විසින් පැවරුම් ලාභියාට ගෙවිය යුතු බවට යථෝක්ත දෙපාර්ශ්වය අතර ඇති කර ගත් ගිවිසුමක් තිබීම.

ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තිය සංශොධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වැනි වගන්තිය (1941 අංක 40 දරණ ආඥා පණතින් සංශෙධිත පරිදි) මෙහි පහත දැක්වෙන පරිදි සංශොධනය කරනු ලැබේ.

(අ) ''කෘෂිකාර්මික දේපොල'' යන්නෙහි අර්ථ නිරූපනය අත්හැර දැමීම .

(ආ) ''ශාඛා මණ්ඩලය'' යන්නෙහි අර්ථ නිරූපනයට එක්බිතිවම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුලත් කිරීම.

''නිශ්චල දේපොල කොන්දේසි සහිතව පවරා දීම යන්නෙන් අදහස් කරනුයේ යම්කිසි නීත්‍යානුකූල නොතාරිස් ලේඛනයක් අනුව හෝ වෙනත් නීත්‍යානුකූල නොතාරිස් ලේඛනයක් අනුව හෝ එවැනි ලේඛනයක සඳහන් කාල සීමාව තුල, යම් දේපොලක් පවරා දුන්, විකුණූ හෝ අන්සතු කළ තැනැත්තාට, ඉහත කී නීත්‍යානුකූල ලේඛනයේ හෝ වෙනත් නීත්‍යානුකූල නොතාරිස් ලේඛනයක් හේතුකොට ගෙන එකී දේපොල බේරා ගැනීම ''අයිතිවාසිකමක් ඇතිව,නිශ්චල දේපොල පවරා දීම, විකිණීම හෝ අන්සතු කිරීම''

(ඇ) ''ණය හිමියා'' යන අර්ථ නිරූපණයෙහි ''ණය වී සිටින'' යන වචනය වෙනුවට ''ණය වී සිටින'' ''සහ'' උරුමක්කාර පොල්මඃ අද්මිනිස්ත්‍රාත් බලකාරයින් හෝ එවැනි පුද්ගලයන් ඇතුලත් වෙයි.

(ඈ) ''ණය ගැතියා'' යන අර්ථ නිරූපණයෙහි

(1) එම වගන්තියේ 1 වැනි පාඨයෙහි ''කෘෂිකාර්මික දේපොලක්'' යන වචන වෙනුවට ''කිසි නිශ්චල දේපොලක්'' යන වචන යෙදීමෙන්.

(2) තත් අර්ථ නිරූපනයේ 2 වැනි පාඨයේ ඒ පාඨයේ අවසානයට යෙදෙන ''තිත් කොමාව'' වෙනුවට කොමාවක් යෙදීමෙන්; සහ

(3) ඒ අර්ථ නිරූපණයේ අවසානයට පහත දැක්වෙන වචන එකතු කිරීමෙන් ''සහ එවැනි පුද්ගලයෙකුගේ හෝ උරුමක්කාර පොල්මඃ අද්මිනිස්ත්‍රාත්කාර බලකාරයින් ඇතුළත් වෙයි.''

(ඉ) ''ණය ගැතියා'' යන්නෙහි අර්ථ නිරූපනයෙන් එක්බිතිවම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපනය ඇතුලත් කිරීමෙන්.

යම්කිසි දේපොළක් සම්බන්ධයෙන් ''උකස'' යන්නට තත් කරුණු පිළිබඳව සියලුම දේ සලකා බැලීමේ දී පැවරුම්කරු විසින් පැවරුම් ලාභියාට ණයට දෙන ලද මුදලට ඇපයක් ලෙස සත්‍ය වශයෙන් අදහස් කරන යම් දේපොලක් කොන්දේසි සහිතව පවරා දීම ඇතුලත් වෙයි.

මේ පණතේ, පැවරුම් ලාභියා විසින් පැවරුම් කරුට දෙන ලද ණයක් ආපසු ගෙවීම සඳහා ඇපයක් ලෙස නියම වශයෙන් අදහස් කරන යම් නිශ්චල දේපොලක් කොන්දේසි රහිතව පවරා දීම සම්බන්ධයෙන් ණය බේරුම් කිරීමේ ආඥා පණත බලපවත්වයි. කෙසේ වුව ද එවැනි නිශ්චල දේපොලක් ඇපයක් වශයෙන් තබා ලබාගත් ණයක් පිළිබඳව ඉල්ලුමක්, ණය ගැතියා විසින් ඉහත කී දේපොල බේරා ගැනීමේ අවසාන දිනට යටත් පිරිසෙයින් තිස් දිනකට පෙර ණය බේරුම් කිරීමේ මණ්ඩලය වෙත ඉදිරිපත් නොකළහොත් මණ්ඩල විසින් පිළි නොගන්නවා ඇත. එවැනි ඉල්ලුම් පතක් මණ්ඩලය විසින් පිළි ගන්නා බව ණය හිමියා වෙත දන්වූ විට, ඔහුට ඒ ඉල්ලුම් පතට අදල දේපොල විකිණීම, අන්සතු කිරීම, පවරාදීම, බදු දීම, හෝ උකස් කිරීම හෝ තහනම් ය.

## 3. 1950 අංක 13 දරණ ආදයම් බදු (සංශොධන) පනත

මේ පණතින් 1958 අය වැය කථාවේ යෝජනා කැබිනට් තීරණයක් මගින් වෙනස් කළ පරිදි ක්‍රියාත්මක කෙරේ. ආදයම් බදු පණතට අවශ්‍ය යයි කල්පනා කරනු ලැබූ වෙනත් සංශෝධන ද මෙයට ඒකාබද්ධ කරන ලදි. මේ පණතින් 1948 අංක 5 දරණ ලාභ පණත අවලංගු කරයි.

## 4. 1959 අංක 14 දරණ පෞද්ගලික බදු පණත

මේ පණතින් පුද්ගලයෙකුගේ, ශුද්ධ ධනය, පෞද්ගලික පාරිභොජනය, වියදම් ත්‍යාග දීමනා අනුව බදු අයකිරීමට ඉඩ සැලසෙයි.

## 5. 1959 අංක 15 දරණ මුදල් බදු (සංශොධන) පණත

මේ පණතින් 1958 අයවැය කථාවේ ඇතුළත්, යෝජනා, කැබිනට් මණ්ඩල යේ තීරණ වලින් වෙනස් කරන ලද පරිදි ක්‍රියාත්මක කෙරේ. මුදල් බදු පණතට අවශ්‍යයයි කල්පනා කරනු ලැබූ තවත් සංශොධන ද ඒකාබද්ධ කරන ලදී.

## 6. 1959 අංක 18 දරණ ලංකා සංවර්ධන ණය (සංශොධන) පනත

1954 අංක 6 දරණ ලංකා සංවර්ධන ණය පණත සංශොධනය කිරීම සඳහා පණතයි.

(අනුමත කළ දිනය—1959 මැයි 18.)

වර්තමාන පාර්ලිමේන්තුවට රැස් වූ ලංකාවේ උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ අනුශාසනය හා අනුමතිය අනුව හා ඇතිව එහිම බලය ප්‍රකාර අත්‍යුත්තම ප්‍රතාපවත් මහා රාජිණිය විසින් පණවනු ලැබේ.

කෙටි නාමය

1. මේ පණත 1959 අංක 18 දරණ ලංකා සංවර්ධන ණය (සංශොධන) පණත යනුවෙන් හැඳින්වෙයි.

1954 අංක 6 දරණ පණතෙහි දීර්ඝ නාමය සංශොධන ය කිරීමයි.

2. 1954 අංක 6 දරණ ලංකා සංවර්ධන ණය පණත යන්නෙහි ''දීර්ඝ නාමය'' (මින්මතු ප්‍රධාන පණත යයි සඳහන් කෙරෙන) මෙයින් ''හය සියය'' යන වචනය වෙනුවට ''එක් දහස'' යන වචනය යොද සංශොධනය කරනු ලැබේ.

ප්‍රධාන පණතේ 2 වන වගන්තිය සංශොධ නය කිරීමයි.

3. ප්‍රධාන පණතේ 2 වැනි වගන්තිය ඒ වගන්තියේ 1 වැනි උප වගන්තිය ''හය සියය'' යන්න වෙනුවට ''එක් දහස'' යන්න යොද මෙයින් සංශොධනය කරනු ලැබේ.

මේ පණතින් ලංකා රජය වෙනුවෙන් කෝටි සියයක උපරිම ප්‍රමාණය දක්වා ණය ගැනීමට මුදල් මණ්ඩලයට බලය පැවරේ. මෙය සම්මත කර ගන්නා තෙක් මුදල් මණ්ඩලයට බලය තිබුනේ රුපියල් කෝටි 60 ක උපරිම ප්‍රමාණය දක්වා ණය ලබා ගැනීමට පමණකි.

## 7. 1959 අංක 10 දරණ බ්‍රෙටන්වුඩ් ගිවිසුම් (සංශෝධන) පනත

1950 අංක 20 දරණ බ්‍රෙටන්වුඩ් ගිවිසුම් පණත සංශෝධනය කිරීම සඳහා පණතයි.

(අනුමත කළ දිනය—1959 අගෝස්තු 27.)

වර්තමාන පාර්ලිමේන්තුවට රැස් වූ ලංකාවේ උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ අනුශාසනය හා අනුමතිය අනුව හා ඇතිව, එහිම බලය ප්‍රකාර අත්‍යුත්තම ප්‍රතාපවත්, මහා රාජිණිය විසින් පණවනු ලැබේ.

කෙටි නාමය

මේ පණත 1959 අංක 19 දරණ බ්‍රෙටන්වුඩ් ගිවිසුම් (සංශෝධන) පණත යනුවෙන් හැඳින්වෙයි.

1950 අංක 20 දරණ පණතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම

මෙයින් පසු ප්‍රධාන පණත යයි සඳහන් කරන 1950 අංක 20 දරණ බ්‍රෙටන්වුඩ් ගිවිසුම් පණතේ 3 වැනි වගන්තිය, එම වගන්තියේ 1 වැනි උප වගන්තියට එක්බිතිවම පහත දැක්වෙන උප වගන්තිය ඇතුලත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"1 (අ) ලංකාවේ කොටස් ප්‍රමාණය වැඩිවීම හේතු කොට ගෙන ලංකා ජාත්‍යන්තර මුදල් මණ්ඩලයට ගෙවිය යුතු සහභාග මුදල වැඩි වුවහොත්, මුදල්, ගිවිසුමේ 3 වැනි ව්‍යවස්ථාවලියෙහි 4 වැනි වගන්තියේ ප්‍රකාර රන්වලින් හෝ ලංකාවේ ව්‍යවහාර මුදල්වලින් ගෙවිය යුතු එවැනි වැඩි කල සහභාග මුදල් ප්‍රමාණය ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් ගෙවිය යුතු ය."

ප්‍රධාන පණතේ 5 වන වගන්තිය සංශෝධනයකිරීම.

3. ප්‍රධාන පණතේ 5 වැනි වගන්තියේ පළමු වැනි උප වගන්තියට එක්බිතිවම පහත දැක්වෙන උප වගන්තිය ඇතුලත් කිරීමෙන් සංශෝධනය කරනු ලැබේ.

"1 (අ) ජාත්‍යන්තර ප්‍රතිසංස්කරණ හා සංවර්ධන බැංකුවේ අනුදත් ප්‍රාග් ධන ප්‍රමාණය වැඩි කළහොත්, බැංකු ගිවිසුමේ 2 වන ව්‍යවස්ථාවලියෙහි 3 වැනි වගන්තියේ "ඇ" ඡේදය යටතේ දැනට ලංකාවේ සහභාග මුදලට සමානුපාතිකව, එවැන් වැඩි කල ප්‍රාග් ධන ප්‍රමාණය ගෙවීමට ලංකාව තීරණය කර ගතහොත්, තත් බැංකුව, යටකී "ඇ" ඡේදයේ කොන්දේසි අනුව තීරණය කරන සහභාග මුදල ගෙවීමට අවශ්‍ය මුදල් ගෙවිය යුත්තේ ඒකාබද්ධ අරමුදලිනි."

ප්‍රධාන පණතේ 7 වැනි වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන පණතේ 7 වැනි වගන්තිය තත් වගන්තියේ 1 වැනි උප වගන්තියේ 1 වැනි කොටස අත්හැර දැමීමෙන් සංශෝධනය කරනු ලැබේ.

**මේ පණතේ සංශෝධනයක් අවශ්‍ය විය. තවත් සංශෝධන කීපයක් දැනට කල්පනාවට භාජනය වෙමින් පවතී.**

## 8. 1959 අංක 21 දරණ මුද්දර (සංශෝධන) පනත.

**පෞද්ගලික බදු පණත පැනවීම හේතුකොට ගෙන උද්ගත වූ සංශෝධන මේ පණතින් ක්‍රියාත්මක කරන අතර විදේශීය රාජ්‍යයන් විසින් දැනට ලංකාවේ ක්‍රියාවේ යොදවනු ලබන නීත්‍යානුකූල ලේඛන සම්බන්ධ නිදහස් කිරීම් ලිහිල් කෙරේ.**

## ආ.—1959 වර්ෂය තුළ මුදල් මණ්ඩලය විසින් යොදා ගන්නා ලද ප්‍රධාන පාලන විධිවිධාන

1959 දෙසැම්බර් 16 වැනි දින,
ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ. පෙ. 590,
කොළඹ 1.

අංක 4 දරණ චක්‍ර ලේඛනය
(59-12-16 වැනි දින ප්‍රතිශෝධිතයි)

### (1) අත්තිකාරම් සඳහා මහ බැංකු පොලිය.

(මුදල් නීති පණතේ 86 වැනි වගන්තිය සම්බන්ධවයි.)

1959 දෙසැම්බර් 16 වැනිද සිට රාජ්‍ය ණය පත් ඇපකොට ලබා ගන්නා අත්තිකාරම් සඳහා මහ බැංකු පොලී ප්‍රමාණය වර්ෂයකට සියයට 3 ක් වෙයි.

එස් ඩී. අමරසිංහ
ප්‍රධාන ගණකාධිකාරී.

ඩී. ඩබ්ලිව්. රාජපතිරාණ
අධිපති.

1959 දෙසැම්බර් 24 වැනි දින දීය.

අංක 4 දරණ චක්‍ර ලේඛනය
(59 - 12 - 24 දින ප්‍රතිශෝධිත)

### (2) අත්තිකාරම් සඳහා මහ බැංකු පොලිය.

1959 දෙසැම්බර් 29 වැනි බ්‍රහස්පතින්ද ගනුදෙනු අවසන් වීමේ සිට, රාජ්‍ය ණයපත් ඇපකොට ලබා ගන්නා අත්තිකාරම් සඳහා මහ බැංකු පොලී ප්‍රමාණය වර්ෂයකට සියයට 2 ක් වෙයි.

එස්. ඩී. අමරසිංහ
ප්‍රධාන ගණකාධිකාරී.

ඩී. ඩබ්ලිව්. රාජපතිරාණ
අධිපති

1 (ආ) පරිශිෂ්ටය

## එක්සත් ජනපදයේ ඩොලර් සඳහා මහ බැංකුවේ විනිමය ගාස්තු

| දිනය | චක්‍ර ලේඛන අංකය | | මිලයට ගැනීම (ඩොලර් 100කට) | විකිණීම (ඩොලර් 100 කට) |
|---|---|---|---|---|
| 1959 | | | | |
| 1/1/59 | 1/117 | එතැන් | රු. 474.75 | රු. 475.00 |
| | | ඉදිරි–තෙමසක් දක්වා | රු. 474.75 | මසකට ශත 50 ක අධි මිලක් එතැන් මිලට එකතුව. |
| 6/1/59 | 1/118 | එතැන් | රු. 474.50 | රු. 474.75 |
| | | ඉදිරි–තෙමසක් දක්වා | රු. 474.50 | මසකට ශත 50 ක අධි මිලක් එතැන් මිලට එකතුව. |
| 9/1/59 | 1/119 | එතැන් | රු. 474.25 | රු. 474.50 |
| | | ඉදිරි–තෙමසක් දක්වා | රු. 474.25 | මසකට ශත 50 ක අධි මිලක් එතැන් මිලට එකතුව |
| 22/1/59 | 1/120 | එතැන් | රු. 474.00 | රු. 474.25 |
| | | ඉදිරි–තෙමසක් දක්වා | රු. 474.00 | මසකට ශත 50 ක අධි මිලක් එතැන් මිලට එකතුව |
| 3/4/59 | 1/121 | එතැන් | රු. 473.85 | රු. 474.10 |
| | | ඉදිරි–තෙමසක් දක්වා | රු. 473.85 | මසකට ශත 50 ක අධි මිලක් එතැන් මිලට එකතුව |
| 7/9/59 | 1/122 | එතැන් | රු. 474.25 | රු. 474.50 |
| | | ඉදිරි–තෙමසක් දක්වා | රු. 474.25 | මසකට ශත 50 ක අධි මිලක් එතැන් මිලට එකතුව |
| 18/9/59 | 1/123 | එතැන් | රු. 474.00 | රු. 474.25 |
| | | ඉදිරි–තෙමසක් දක්වා | රු. 474.00 | මසකට ශත 50 ක අධි මිලක් එතැන් මිලට එකතුව |
| 9/11/59 | 1/124 | එතැන් | රු. 474.50 | රු. 474.75 |
| | | ඉදිරි–තෙමසක් දක්වා | මසකට ශත 50 ක් එතැන් මිලෙන් වට්ටම් කොට | මසකට ශත 50 ක අධි මිලක් එතැන් මිලට එකතුව |
| 30/11/59 | 1/125 | එතැන් | රු. 474.75 | රු. 475.00 |
| | | ඉදිරි–තෙමසක් දක්වා | මසකට ශත 50 ක් එතැන් මිලෙන් වට්ටම් කොට | මසකට ශත 50 ක අධි මිලක් එතැන් මිලට එකතුව |
| 7/12/59 | 1/126 | එතැන් | රු. 475.25 | රු. 475.50 |
| | | ඉදිරි–තෙමසක් දක්වා | මසකට ශත 25 ක් එතැන් මිලෙන් වට්ටම් කොට | රු. 475.50 |